2827

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2022 (2023 මාර්තු)
Year End Evaluation

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ශ්‍රේණිය தரம் Grade | 11 | විෂයය பாடம் Subject | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | පත්‍රය வினாத்தாள் Paper | I | කාලය காலம் Time | පැය 01 |

සැලකිය යුතුයි.

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 කි.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට ඇති (1) (2) (3) (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
- I ප්‍රශ්න පත්‍රයේ පිළිතුරු II පත්‍රයේ පිළිතුරු සමඟ අමුණා භාර දෙන්න.

---

1. සන්නිවේදනයේ මූලිකාංග, ලැස්වෙල්ගේ අර්ථකතනය අධ්‍යයනය කිරීම තුළින් මනාව පැහැදිලි වේ. මේ අනුව එම සන්නිවේදන මූලිකාංගවල අනුපිළිවෙළ වන්නේ,
   (1) සන්නිවේදකයා, පණිවිඩය, බාධක, ග්‍රාහකයා හා අග්‍රස්ථානය වේ.
   (2) සන්නිවේදකයා, සම්ප්‍රේෂක, , ග්‍රාහකයා, බාධක, හා අත්දැකීම් පසුතලය වේ.
   (3) තොරතුරු මූලාශ්‍රය, පණිවිඩය, මාධ්‍ය, ග්‍රාහකයා හා බලපෑම් වේ.
   (4) සන්නිවේදකයා, සන්දේශය, මාධ්‍ය, ග්‍රාහකයා හා බලපෑම වේ.

2. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස තහවුරු කරන්නේ,
   (1) 15 (7) අනු ව්‍යවස්ථාවෙනි.
   (2) 19 වන ව්‍යවස්ථාවෙනි.
   (3) 15 (2) අනු ව්‍යවස්ථාවෙනි
   (4) 14 (1) අනු ව්‍යවස්ථාවෙනි.

3. "බල්ලෙකු, මිනිසෙකු සපා කෑ විට පුවෘත්තියක් නොවූවත් මිනිසෙක් බල්ලෙකු සපා කෑ විට ප්‍රවෘත්තියෙක් වේ." මෙම ප්‍රකාශය ඉදිරිපත් කළේ,
   (1) ගේබ්‍රියල් ස්කේද් ය.
   (2) චාර්ල්ස් ඇන්ඩර්සන් ඩානා ය.
   (3) පෝල් ඩී මැසෙනියර් ය.
   (4) මිල්ටන් බ්‍රෂ් ය.

4. පුවත්පතෙහි කතුවැකියෙහි ඇතුළත් වන්නේ,
   (1) හිමිකාරීත්වය දරණ අදහසයි.
   (2) සමාජ ප්‍රගමනයට හේතු වන අදහස් ය.
   (3) ප්‍රධාන කර්තෘගේ දෘෂ්ටියයි.
   (4) හිමිකරුගේ සහ කර්තෘ මණ්ඩලයේ මතයයි.

5. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මගින් පරීක්ෂා කර බලනුයේ,
   (1) රජයේ නිලධාරීන් අතින් සිදුවන මානව හිමිකම් කඩවීම් පිළිබඳව යි.
   (2) විශ්ව මානව හිමිකම් ප්‍රකාශනයේ අයිතීන් කඩවීම් පිළිබඳව යි.
   (3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් කඩවීම පිළිබඳව යි.
   (4) පෞද්ගලිකත්වය ආක්‍රමණය කිරීම පිළිබඳව යි.



Scanned with CamScanner

6. වර්තමාන තැපැල මගින් පෞද්ගලික ලිපි හුවමාරු වීම ඉතා පහළ මට්ටමක පවතින බව ප්‍රවෘත්තියක පළ විය. ඒ සඳහා බොහෝ දුරට හේතු විය හැක්කේ,
(1) SMS හෙවත් කෙටි පණිවිඩ යැවීමට හැකි වීමයි.
(2) විද්‍යුත් තැපැල භාවිතය වැඩිවීමයි.
(3) ලිපි ලිවීමට ජනතාවට කාලය නැතිවීමයි.
(4) දුරකථන භාවිතය ඉතා ඉහළ යෑමයි.

7. ඡායාරූපයක වස්තුව පැහැදිලිව තිබිය දී, පසුබිම් අපැහැදිලි කිරීමට අවශ්‍ය වී තිබේ. එසේ කිරීම නම්,
(1) වස්තු දුර අඩු කළ යුතුය.
(2) කාච විවරය වැඩි කළ යුතුය.
(3) නාභි දුර වැඩි කළ යුතුය.
(4) ද්වාර වේගය අඩු කළ යුතුය.

8. පරිකල්පනය වඩාත් ප්‍රබල ලෙස යොදාගත හැකි ජනමාධ්‍ය වන්නේ,
(1) රූපවාහිනිය
(2) අන්තර්ජාලය
(3) පුවත්පත
(4) ගුවන් විදුලිය

9. රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදන ක්‍රියාවලියේ අනුපිළිවෙළ වන්නේ,
(1) පෙර නිෂ්පාදනය, නිෂ්පාදනය, පසු නිෂ්පාදනය වේ.
(2) නිෂ්පාදනය, පසු නිෂ්පාදනය, සංස්කරණය වේ.
(3) පිටපත් රචනය, පෙර නිෂ්පාදනය, නිෂ්පාදනය වේ
(4) පිටපත් රචනය, නිෂ්පාදනය, සංස්කරණය වේ.

10. කාර්යාලයීය මාධ්‍ය උපකරණ අතර යල් පැන යමින් ඇත්තේ,
(1) දුරකථනය යි.
(2) ඡායා පිටපත් යන්ත්‍රය යි.
(3) ස්කෑන් යන්ත්‍රය යි.
(4) විද්‍යුත් යතුරු ලියනය යි.

11. ස්වයං වාරණය යනු,
(1) රජය මගින් නිසි බලධරයෙකු පත් කිරීමයි.
(2) ජනමාධ්‍ය හිමිකරුවාගේ වාරණයට යටත් වීමයි.
(3) පවත්නා ආචාර ධර්ම පද්ධතිවලට එරෙහි වීමයි.
(4) පොදු සම්මුතීන් සලකා තොරතුරු වාරණය කිරීමයි.

12. ඕෆ්සෙට් මුද්‍රණයේ දී යොදා ගැනෙන මූලික වර්ණ හතර වන්නේ,
(1) නිල්, රතු, කොළ, කළු
(2) රතු, කොළ, මැජෙන්ටා, කළු
(3) සයන්, මැජෙන්ටා, කහ, කළු
(4) සයන්, රතු, නිල්, කළු

13 දිනපතා පුවත්පතක ප්‍රවෘත්ති සංස්කාරකගේ ප්‍රධාන භූමිකාව වන්නේ,
(1) ප්‍රාදේශීය මට්ටමින් ප්‍රවෘත්ති වාර්තා රැස් කිරීමයි.
(2) පුවත්පතේ සමස්ත වගකීම දැරීමයි.
(3) ප්‍රවෘත්ති තෝරා ගැනීම හා ප්‍රවෘත්ති සංස්කරණය යි.
(4) දිනපතා පුවත්පතට දේශපාලන ලිපිය රචනා කිරීමයි.

14. පෝටර්. ග්‍රිෆිත්, අයින්ස්ටයින් ආදීන්ගේ දායකත්වය ප්‍රධාන වශයෙන් ලැබී ඇත්තේ,
(1) රූපවාහිනී මාධ්‍යයට ය.
(2) පුවත්පත් මාධ්‍යයට ය.
(3) ගුවන් විදුලි මාධ්‍යයට ය.
(4) සිනමා මාධ්‍යයට ය.



Scanned with CamScanner

15. යුනෙස්කෝ සංවිධානය ප්‍රවෘත්තියක විශ්වාසනීයත්වය සම්බන්ධ මූලික සාධක පහත සූත්‍රය ඇසුරෙන් දක්වා ඇත.

A + B + C = D

මෙම අංග අනුපිළිවෙළින් සකස් විය යුතු අයුරු නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,
(1) නිරවද්‍ය බව + සමතුලිත බව + පැහැදිලි බව = විශ්වසනීයත්වය
(2) පැහැදිලි බව + සරල බව + කැපී පෙනීම = විශ්වසනීයත්වය
(3) සමීප බව + නිරවද්‍ය බව + බලපෑම = විශ්වසනීයත්වය
(4) අලුත් බව + කැපී පෙනීම + සමීප බව = විශ්වසනීයත්වය

16. දිනපතා පුවත්පතක මුල් පිටුවේ බොහෝ විට ඇතුළත් වන්නේ,
(1) මෘදු ප්‍රවෘත්ති ය.
(2) නිල ප්‍රවෘත්ති ය.
(3) දෘඪ ප්‍රවෘත්ති ය.
(4) රාජ්‍ය ප්‍රවෘත්ති ය.

17. ශබ්දය, විද්‍යුත් ශක්තියක් බවට හරවා එක් තැනක සිට තවත් තැනකට යැවිය හැකි බව මුල්වරට හෙළි කළේ,
(1) ජේම්ස් ක්ලාක් මැක්ස්වෙල් ය.
(2) තෝමස් අල්වා එඩිසන් ය.
(3) ගුග්ලි එල්මෝ මාර්කෝනි ය.
(4) ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම් බෙල් ය.

18. පුවත්පතක සංස්කාරක මණ්ඩලයට අයත් වන්නේ,
(1) නියෝජ්‍ය සංස්කාරක, විචිත්‍රාංග ලේඛකයින්, දැන්වීම් කළමණාකරු සහ මාණ්ඩලික වාර්තාකරුවන් ය.
(2) ප්‍රධාන සංස්කාරක, දැන්වීම් කළමනාකරු, මුද්‍රණ කළමණාකරු හා බෙදාහැරීම් කළමණාකරු ය.
(3) අධ්‍යක්ෂ, ප්‍රධාන සංස්කාරක, උප සංස්කාරක සහ මාණ්ඩලික වාර්තාකරුවන් ය.
(4) ප්‍රධාන සංස්කාරක, උප සංස්කාරක, ඡායාරූප ශිල්පීන් සහ පිටු සැලසුම් ශිල්පීන් ය.

19. ලෝක ව්‍යාප්ත ජාලයේ (World Wide Web) නිර්මාතෘවරයා ලෙස සැලකෙන්නේ,
(1) එඩ්වඩ් හාපර් ය.
(2) ටිම් බර්නර්ස් ලී ය.
(3) ආතර් සී ක්ලාක් ය.
(4) ජෝන් ලොගී බෙයාර්ඩ් ය.

20. සිනමා මාධ්‍යය භාවිත කරන්නෙකුට වඩාත් වැදගත් සිද්ධාන්තයක් වන්නේ,
(1) දුර දෘෂ්ටිකත්වය යි.
(2) ක්ෂේත්‍ර ගැඹුර යි.
(3) දෘෂ්ටියේ අඛණ්ඩතාවය යි.
(4) දෘෂ්ටි ගෝචරභාවය යි.

21 සංවෘත පරිපථ රූපවාහිනිවල (CCTV) අරමුණ වන්නේ,
(1) පසුගිය වැඩසටහන් නැරඹීමේ පහසුකම් සැපයීම යි.
(2) දේශීය හා විදේශීය සේවා ලබා දීම යි.
(3) අභ්‍යන්තර හා බාහිර පරිසර සුපරීක්ෂණය යි.
(4) සෘජුව නිවෙස් වෙත සේවා සැපයීම යි.

22. නිරවද්‍ය තොරතුරු වාර්තා කිරීමේ දී, මාධ්‍යවේදියෙකුට වඩා උචිත මූලාශ්‍රය වන්නේ,
(1) ප්‍රවෘත්ති සාකච්ඡා ය.
(2) ප්‍රවෘත්ති දිනපොත් ය.
(3) ප්‍රවෘත්ති ඒජන්සි ය.
(4) ප්‍රවෘත්ති නිවේදන ය.

23. ශ්‍රී ලංකාවේ මාධ්‍ය භාවිතයට අදාළ වූ ආචාර ධර්ම පද්ධතියකට අයත් නොවන්නේ,
(1) ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ වෘත්තිය ප්‍රතිපත්ති මාලාව.
(2) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනතේ ආචාර ධර්ම ලේඛනය.
(3) නිදහස් මාධ්‍ය සංසදයේ ආචාර ධර්ම මාලාව.
(4) ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලයේ නීති මාලාව.



Scanned with CamScanner

24. ශ්‍රී ලංකාවේ ප්‍රථම ප්‍රාදේශීය ගුවන් විදුලි සේවාව වන්නේ,
(1) රජරට සේවය යි.
(2) වයඹ සේවය යි.
(3) රුහුණු සේවය යි.
(4) මහනුවර සේවය යි.

25. ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත පළමු රූපවාහිනී මාලා නාට්‍ය වන්නේ,
(1) දිමුතු මුතු ය.
(2) කඩුල්ල ය.
(3) පළිඟු මැණිකේ ය.
(4) රටගිය ඇත්තෝ ය.

26. පුවත්පතක් සැලසුම් කිරීමේ දී මුලින් ම ඉඩ වෙන්කරනු ලබන්නේ,
(1) ශීර්ෂ පාඨවලට ය.
(2) වෙළඳ දැන්වීම් සඳහා ය.
(3) රජයේ තොරතුරු වෙනුවෙනි.
(4) ප්‍රවෘත්ති වෙනුවෙනි.

27. ශ්‍රී ලංකාවේ පළවන ප්‍රධාන දිනපතා ජාතික පුවත්පත් බොහෝමයක් අයත් වන ප්‍රමාණ කාණ්ඩය වන්නේ,
(1) බ්‍රෝඩ් ෂීට් (Broad sheet) ය.
(2) කොම්පැක්ට් (Compact) ය.
(3) ටැබ්ලොයිඩ් (Tabloid) ය.
(4) ෆුල් ඩිමයි (Fulldemy) ය.

28. ජනමාධ්‍ය ආයතනයක අභ්‍යන්තර මාධ්‍යවේදීන්,
(1) නිදහස් මාධ්‍යවේදීන් වේ.
(2) පුරවැසි මාධ්‍යවේදීන් වේ.
(3) මාණ්ඩලික මාධ්‍යවේදීන් වේ.
(4) ප්‍රාදේශීය මාධ්‍යවේදීන් වේ.

29. පුවත්පත් වර්ග කිරීමේ දී මූලික සාධකයක් නොවන්නේ,
(1) මුද්‍රණ වාරයයි
(2) පුවත්පත් ප්‍රමාණයයි.
(3) පිටු සංඛ්‍යාවයි
(4) පාඨක ස්වභාවයයි.

30. මාධ්‍ය විචාරකයා යනු,
(1) මාධ්‍ය - ග්‍රාහක සම්බන්ධතාව ශක්තිමත් කරන්නා ය.
(2) ජනමාධ්‍ය ආයතනවල සේවය කරන වෘත්තිකයෙකි
(3) මාධ්‍ය ආයතන සඳහා සේවා සපයන පුද්ගලයෙකි.
(4) සංදේශවල ගුණදොස් පෙන්වා දී මාධ්‍ය කර්මාන්තය පවත්වාගෙන යාමට රුකුල් දෙන්නෙකි.

31. රිය අනතුරු, මනුෂ්‍ය ඝාතන ආදියෙහි ලේ තැවරුණු මෘත ශරීර මෙන්ම ඒවායේ වර්ණ ඡායාරූප පුවත්පත් වල මුල් පිටුවල පළකිරීමෙන් වැළකී සිටීම
(1) ආගමික විශ්වාස අනුව සිදුවන්නකි.
(2) මාධ්‍ය සදාචාරයට පටහැනි වූවකි.
(3) මධ්‍ය ආචාර ධර්මවලට අදාළ ක්‍රියාවකි.
(4) මාධ්‍ය නිදහසට තර්ජනයකි.

32. දෘශ්‍ය ප්‍රකාශන විධිමත් ක්‍රමයක් නොවන වරණය තෝරන්න.
(1) අකුරු
(2) ප්‍රස්ථාර
(3) බෙරහඬ
(4) ඡායාරූප

33. ජංගම දුරකථන වෙත ප්‍රවෘත්ති ලබාදීම වර්තමානයේ ජනප්‍රිය වෙමින් පවතී. මෙම ක්‍රියාවලියේ දී වඩාත් අවධානය යොමුවිය යුත්තේ,
(1) ප්‍රවෘත්ති සමබරතාව පිළිබඳවයි.
(2) භාෂා භාවිතය පිළිබඳවයි.
(3) සංක්ෂිප්ත බව පිළිබඳවයි.
(4) නිරවද්‍යතාව පිළිබඳවයි.

2823

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2022 (2023 මාර්තු)
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

සැලකිය යුතුයි

- පළමුවැනි ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමුවැනි ප්‍රශ්නයට ලකුණු 20 ක් හිමි වන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකට ම ලකුණු 10 බැගින් හිමි වේ.

---

1. මීට මාස කිහිපයකට පෙර රටේ ඇති වූ ආර්ථික අර්බුදය හමුවේ ඉන්ධන සැපයුම සීමා කරන බවත්, ලැබෙන ඉන්ධන ප්‍රමාණය බෙදාහැරීම සඳහා QR කේතයක් හඳුන්වා දෙන බවත්, රජය විසින් ප්‍රකාශයට පත් කරන ලදී.
   (1) මෙම ප්‍රවෘත්තිය අයත්වන ප්‍රවෘත්ති ප්‍රභේදය කුමක් ද යි නම් කරන්න.
   (2) නව ඉන්ධන ක්‍රමවේදය පිළිබඳව ජනතාව දැනුම්වත් කිරීමට යොදාගත හැකි විද්‍යුත් මාධ්‍යයන් දෙකක් නම් කරන්න.
   (3) ප්‍රමාණය අනුව හඳුනාගත හැකි පුවත්පත් වර්ග දෙක නම් කරන්න.
   (4) හිමිකාරීත්වය අනුව ජනමාධ්‍ය බෙදෙන ප්‍රධාන ප්‍රභේද දෙක නම් කරන්න.
   (5) ජනමාධ්‍යයන්ට අමතරව ඔබට තොරතුරු ලබාගැනීමට ඉවහල් වූ සමාජ මාධ්‍ය විධික්‍රම දෙකක් ලියන්න.
   (6) නව ක්‍රමවේදය පිළිබඳව අවට සමාජය පුරා විවිධ තොරතුරු වේගයෙන් පැතිර ගිය බැවින් ඒ පිළිබඳව මාධ්‍ය හරහා නිසි දැනුම්වත් කිරීමක් කඩිනමින් කිරීමට සිදුවිය. එම තොරතුරු වේගයෙන් පැතිර ගිය අවිධිමත් සන්නිවේදන දාමයන් දෙකක් ලියන්න.
   (7) තොරතුරු රැස් කරන්නෙකු සතු විය යුතු මූලික ගුණාංග දෙකක් ලියන්න.
   (8) QR කේතය පරීක්ෂා කිරීම සඳහා එම ආයතනයට තිබිය යුතු සන්නිවේදන මෙවලම කුමක් ද?
   (9) නව ක්‍රමවේදය හඳුන්වා දීමට පෙර පැවතියේ අංක සහිත කූපන් ක්‍රමයකි. ඒ සඳහා භාවිත කරන්නට ඇතැයි සැලකෙන කාර්යාලයීය මාධ්‍ය උපකරණ දෙකක් දක්වන්න.
   (10) QR කේතය මුද්‍රණය කරවා ආරක්ෂිතව රඳවා ගැනීමට යොදාගත හැකි ක්‍රමය කුමක් ද?

2. තොරතුරු හුවමාරුව සඳහා නිවැරදි භාෂාවක් භාවිත කිරීම වර්තමාන මාධ්‍ය පරිහරණයේ දී ඉතා වැදගත් කරුණකි.
   (1) වාචික භාෂාවට වඩා වෙනස් ලෙස ලිඛිත භාෂාව ගොඩනැගී ඇති බව පෙන්නුම් කිරීම හඳුන්වන නම කුමක් ද?
   (2) නිර්වාචික සන්නිවේදන විධික්‍රම හතරක් නම් කරන්න.
   (3) ප්‍රවෘත්ති සම්පාදනය කිරීමේ දී ප්‍රවෘත්ති වාර්තාකරුවන් යොදා ගන්නා ආකෘති නම් කර, එය රූප සටහනකින් පැහැදිලි කරන්න.
   (4) පුවත්පත හඳුනාගත හැක්කේ එහි අන්තර්ගතය නිසි ලෙස විමර්ශනයෙනි. එහි අන්තර්ගතයට අයත් අංග හතරක් පැහැදිලි කරන්න.



Scanned with CamScanner

3. විවිධ රසඥතාවෙන් යුතු ග්‍රාහකයන් අරමුණු කර ගනිමින් තොරතුරු හුවමාරුව සඳහා ප්‍රබල මාධ්‍ය බිහි වී ඇත.
   (1) සිනමා මාධ්‍යයේ බිහි වීමට විශාල දායකත්වයක් සැපයූ සිද්ධාන්තය කුමක් ද?
   (2) ප්‍රධාන ග්‍රාහක ස්වරූප දෙක නම් කරන්න.
   (3) වර්තමානයේ බොහෝ කාර්යයන් සඳහා විද්‍යුත් තැපැල භාවිත වේ. ඉන් ලැබෙන ප්‍රයෝජන තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න.
   (4) දෘශ්‍ය සන්නිවේදන ස්වරූපයක් ලෙස ක්‍රියාත්මක පන්ති කාමර මාධ්‍ය උපකරණ හතරක් පැහැදිලි කරන්න.

4. 'මිනිසුන්ගේ සිතුම් පැතුම් චර්යාවන් නිවැරදි දිශානතියකට යොමු කිරීමට නම්, නිර්මාණශීලි මාධ්‍ය භාවිතය වැදගත් වේ.
   (1) තාක්ෂණයේ දියුණුවත් සමග විවිධ මාධ්‍ය "එකට හමුවීම" හඳුන්වන නම කුමක් ද?
   (2) නූතනයේ පුද්ගලාන්තර සන්නිවේදනය සඳහා විවිධ මෙවලම් යොදා ගනියි. එවැනි මෙවලම් හතරක් ලියන්න.
   (3) නිර්මාණාත්මක සන්නිවේදනයේ දී යොදා ගන්නා ප්‍රකාශන විධි තුනක් නම් කර, ඒවා කෙටියෙන් සඳහන් කරන්න.
   (4) වාර්තාකරණයේ දී භාවිත කළ හැකි තොරතුරු මූලාශ්‍රයන් හතර නම් කර කෙටියෙන් විස්තර කරන්න.

5. අප ජීවත් වන්නේ දැනුම් සමාජයක බැවින් තාක්ෂණයේ දියුණුවත් සමගින් මිනිසා වේගවත් සන්නිවේදනයක්.කරා ගමන් කරමින් සිටී.
   (1) ශ්‍රී ලංකාවේ දැනට බහුල ලෙස භාවිත වන ගුවන් විදුලි තරංග වර්ගය කුමක් ද?
   (2) මාධ්‍ය වෙත ප්‍රතිචාර ඉදිරිපත් කළ හැකි ක්‍රම හතරක් නම් කරන්න.
   (3) විද්‍යුත් පුවත්පතේ විශේෂතා තුනක් පැහැදිලි කරන්න.
   (4) ඩිජිටල් ඡායාරූපකරණයේ විශේෂතා හතරක් පැහැදිලි කරන්න.

6. ලොව කොතැනක කුමක් සිදු වුව ද ක්ෂණිකව එම සිදුවීම් සමාජගත කිරීමට තරම් පුළුල් මාධ්‍ය ප්‍රචාරණයක් ලොව පුරා මේ වන විට ශීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතී.
   (1) නිහඬ සිනමාවේ පුරෝගාමියා කවුරුන් ද?
   (2) මාධ්‍ය ආයතනයකට සම්බන්ධ මාධ්‍ය ශ්‍රමිකයන් දෙපාර්ශවය නම් කරන්න.
   (3) දක්ෂ සන්නිවේදකයෙකු වීමට ඔබ සතුවිය යුතු වාචික සන්නිවේදන නිපුණතා තුනක් පැහැදිලි කරන්න.
   (4) පන්ති කාමර මාධ්‍ය උපකරණ භාවිතයේ වාසි හතරක් විස්තර කරන්න.

7. ළමා පරපුරේ සිට මහලු විය දක්වා ම විවිධාකාර රුචිකත්වයන්ට නොයෙකුත් හැඩතල ලබා දෙමින් ප්‍රේක්ෂකයා අතික්‍රමණය කිරීමට වර්තමානයේ පුංචි තිරය සමත්කම් දක්වා තිබේ.
   (1) 1982 ජපන් රජයේ පරිත්‍යාගයක් ලෙසින් මෙරට ආරම්භ වූ රූපවාහිනී ආයතනය කුමක් ද?
   (2) බුද්ධිමය දේපළ සම්බන්ධ අයිතිවාසිකම් දෙවර්ගය නම් කරන්න.
   (3) පවතින තරඟකාරීත්වය හමුවේ ගුවන් විදුලි නාලිකා සිය ග්‍රාහකයන් පොළඹවා ගැනීමට යොදන උපක්‍රම තුනක් පැහැදිලි කරන්න.
   (4) රූපවාහිනී මාධ්‍ය වැඩසටහන් ප්‍රභේද හතරක් කෙටියෙන් හඳුන්වන්න.



Scanned with CamScanner

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව බස්නාහිර පළාත් ... මேல் மாகாணக் கல்வித் திணைக்களம் ... Western Province Education Department Western Province ...

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2022 (2023 මාර්තු)
**Year End Evaluation**

පිළිතුරු පත්‍රය
**Marking Scheme**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II |

## පිළිතුරු පත්‍රය I කොටස

| | | | |
|---|---|---|---|
| 1. - 4 | 11. - 4 | 21. - 3 | 31. - 3 |
| 2. - 4 | 12. - 3 | 22. - 1 | 32. - 3 |
| 3. - 2 | 13. - 4 | 23. - 4 | 33. - 4 |
| 4. - 4 | 14. - 4 | 24. - 1 | 34. - 1 |
| 5. - 1 | 15. - 1 | 25. - 1 | 35. - 3 |
| 6. - 2 | 16. - 3 | 26. - 2 | 36. - 4 |
| 7. - 2 | 17. - 1 | 27. - 1 | 37. - 4 |
| 8. - 4 | 18. - 1 | 28. - 3 | 38. - 3 |
| 9. - 1 | 19. - 2 | 29. - 3 | 39. - 4 |
| 10. - 4 | 20. - 3 | 30. - 4 | 40. - 3 |

(1×40 = 40)

## II කොටස


01. (i) දෑඩි පුවත්
(ii) ගුවන් විදුලිය
රූපවාහිනි
(iii) බෝඩ්ෂීට් පුවත්පත්
ටැබ්ලොයිඩ් පුවත්පත්
(iv) රාජ්‍ය හිමිකම
පෞද්ගලික හිමිකම
(v) මුහුණු පොත Face fook , වට්ස් ඇප්ස් Whatsapp වයිබර් Viber,
ට්විටර් Twitter, Messenger
(vi) තනි දාමය, ඕපාදූප දාමය, සම්භාවිතාදාමය, පර්ෂද දාමය
(vii) පුවත් ඉව, තොරතුරු මූලාශ්‍රය පිළිබඳ දැනුම්වත් බව, ඉවසීම, හොඳ නිරීක්ෂකයෙකු වීම, ආචාරශීලී බව, සුහද බව, උපායශීලි බව, අපක්ෂපාතී බව, කාල කළමනාකරණය.
(viii) ජංගම දුරකථනය
(ix) දින මුද්‍රාව හා නිල මුද්‍රාව
(x) ලැමිනේට් කිරීම

(2×10 = 20)

02 (i) භාෂා ද්වි රූපතාව (ලකුණු 01)

(ii) මුහුණේ ඉරියව්, අක්ෂි සම්බන්ධතාව, ඉඟි, අංගචලනය, ඉරියව්, නිහඬතාව, ගන්ධය, ආචාර විධික්‍රම, සංඥා සංකේත, අභිනය, ඇඳුම් පැළඳුම්, හඬ, ස්පර්ශය (ලකුණු 02)

(iii)




(ලකුණු 03)

(iv) ප්‍රවෘත්ති, සංස්කාරක වැකිය, විශේෂාංග, කාටූන්, තීරු ලිපි, ඡායාරූප වාර්තා, වෙළෙඳ දැන්වීම්

(ලකුණු 04)

03 (i) දෘෂ්ටියේ අඛණ්ඩතාව (ලකුණු 01)

(ii) සක්‍රීය ග්‍රාහක හා නිෂ්ක්‍රීය ග්‍රාහක (ලකුණු 02)

(iii) * ක්ෂණිකව තොරතුරු ලබා දීමට සහ ලබා ගැනීමට හැකිවීම.
* එකවර විශාල පිරිසකට තොරතුරු ලබා දීමට හැකිවීම.
* විවිධාකාරයේ තොරතුරු ලබා දීමට හැකිවීම.
* රහස්‍යභාවය ආරක්ෂා කර ගත හැකිවීම.
* ලබන්නා ලිපිය කියවනතෙක් ඔහුගේ විද්‍යුත් තැපැල් ලිපිනය යටතේ එම ලිපිය රඳවා තිබීම
* සාපේක්ෂව මිල අඩු වීම.
* ලැබෙන ලිපි හා යවනු ලබන ලිපි අනුපිළිවෙලින් ගබඩා කර තබා ගත හැකි වීම.

(ලකුණු 03)

(iv) කලු ලෑල්ල, සුදු ලෑල්ල, කාන්දම් ලෑල්ල, පත්‍රිකා ලෑල්ල, පිටු පෙරළන ලෑල්ල, ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රය, කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රය, ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රය, බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය, අන්තර් ක්‍රියාකාරී පුවරුව, (පිටු අංක 84 - 91 දක්වා 10 ශ්‍රේණිය) (ලකුණු 04)

04. (i) අභිසාරීතාව (ලකුණු 01)

(ii) තැපැල් ලිපි, ෆැක්ස් පණිවිඩ, දුරකථන (ජංගම හා ස්ථාවර), විද්‍යුත් තැපැල, අන්තර්ජාල දුරකථන, සමාජ ජාල, වැනි නවමාධ්‍ය (ලකුණු 02)

(iii) * භාෂාත්මක ප්‍රකාශන විධි
* ශ්‍රව්‍ය ප්‍රකාශන විධි
* දෘශ්‍ය ප්‍රකාශන විධි
* ශ්‍රව්‍ය දෘෂ්‍ය ප්‍රකාශන විධි
(පිටු අංක 91, 92, 93, - 11 ශ්‍රේණිය) (ලකුණු 03)

(iv) * පුද්ගල මූලාශ්‍ර
* ආයතනික මූලාශ්‍ර
* ලිඛිත මූලාශ්‍ර
* මාධ්‍ය මූලාශ්‍ර
(පිටු අංක 9 සහ 10 - 11 ශ්‍රේණිය) (ලකුණු 04)

05. (i) FM තරංග, සංඛ්‍යාත මූර්ජන තරංග (ලකුණු 01)

(ii) * තැපැල්පත්
* දුරකථන ඇමතුම්
* විද්‍යුත් තැපෑල
* කෙටි පණිවිඩ
* සමාජ ජාල වෙබ් අඩවි
* පුවත්පත්වලට ලිපි සම්පාදනය
* ලිපියක් ලෙස සකසා ප්‍රතිචාර දන්වා යැවීම.
* මාධ්‍ය පා ගමනක් හෝ උද්ඝෝෂණයක් සංවිධානය කිරීම. (ලකුණු 02)

(iii) * ක්ෂණිකව පුවත් දැන ගැනීමේ හැකියාව
* ගබඩා කර තබා ගැනීමේ පහසුව
* නැවත නැවත කියවිය හැකි වීම.
* තොරතුරු විෂයයන් අනුව වර්ග කරමින් පළ කොට තිබීම.
* යාවත්කාලීන කිරීමේ පහසුකම් වැඩිවීම.
* ක්ෂණික පාඨක ප්‍රතිචාර ලැබීම. (ලකුණු 03)

(iv) * ලබාගත් ඡායාරූප ඒ අවස්ථාවේ දී ම නැරඹිය හැකිවීම.
* රසායනික ඡායාරූපකරණයේ දී මෙන් පැසුරුම්කරණය සඳහා කාලය ගත නොවන බැවින් ඉහළ කාර්යක්ෂමතාව
* අනවශ්‍ය ඡායාරූප මකා දැමිය හැකි නිසා මතක කාඩ් පතේ ධාරිතාව ඵලදායි අයුරින් යොදාගත හැකි වීම.
* පහසුවෙන් පරිගණකය හා සම්බන්ධ කළ හැකි නිසා කාර්යක්ෂමව සංස්කරණය කිරීමේ පහසුව.
* විද්‍යුත් තැපෑල, අන්තර් ජාලය, ජංගම දුරකථනය වැනි සන්නිවේදන ජාලයන්ට පහසුවෙන් යොමු කළ හැකිවීම
* අංකිත දත්ත ගොනු වශයෙන් ගබඩා කරන නිසා කාලාන්තරයකට පසුව වුව ද ඡායාරූපයක ගුණාත්මකභාවය ආරක්ෂා වී පැවැතීම. (ලකුණු 04)

06. (i) චාලි චැප්ලින් (ලකුණු 01)

(ii) * මාණ්ඩලික මාධ්‍යවේදීන්, ප්‍රාදේශීය මාධ්‍යවේදීන්, (ලකුණු 02)

(iii) * තමා සතු තොරතුරු - අදහස් ප්‍රමාණය පුළුල් කර ගැනීම
* කථන රටා පුහුණුවීම.
* කථන රටා සඳහා පෙර සූදානම .
* අන්‍යයන්ගේ කථා හා අංග චලනය හා ඉරියව් අධ්‍යයනය.
* සවන් දීමට පුහුණු වීම.
* කථනය සමඟ අංග චලනය හා ඉරියව් භාවිතය පුහුණුව. (ලකුණු 03)

(iv) * ඉගෙනුම් - ඉගැන්වීම් කාර්යය පහසු කිරීම.
* ඉගෙනුම් - ඉගැන්වීම් කාර්යයෙහි ඵලදායීතාව ඉහළ නැංවීම.
* ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් උදෙ‍යෝගිමත් හා ආකර්ෂණීය බවට පත් කිරීම.
* තොරතුරු ග්‍රහණය කර ගැනීමට, තේරුම් ගැනීමට, මතකයේ රඳවා ගැනීමට. ග්‍රාහකයන්ට පහසු වීම.
* ඉදිරිපත් කරනු ලබන තොරතුරුවලට අදාළව විවිධ මාධ්‍ය ස්වරූප මගින් පෙර සැකසුම් කරන ලද හා ඒ අවස්ථාවේ දී සැකසුම් කරනු ලබන ඡායාරූප, රූප සටහන්, චලන දර්ශන ආදිය ඉදිරිපත් කළ හැකිවීම.
* ඉගෙනුම් - ඉගැන්වීම් පරිසරය ප්‍රියජනක බවට පත්වීම. (ලකුණු 04)

07. (i) ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව (ලකුණු 01)

(ii) ආර්ථික අයිතිවාසිකම් /සදාචාර අයිතිවාසිකම් (ලකුණු 02)

(iii) මුදල් ලබාදීම, විවිධ ත්‍යාග ලබාදීම, විවිධ වැඩසටහන් ආකෘති හඳුන්වාදීම, ශ්‍රාවකයා සජීවීව සම්බන්ධකර ගැනීම, ආකර්ෂණීය කථන විලාසය, සමාජ සත්කාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. (ලකුණු 03)

(iv) - ප්‍රවෘත්ති හා කාලීන වැඩසටහන්
- සඟරාමය වැඩසටහන්
- ටෙලි නාට්‍ය
- සංගීත වැඩසටහන්
- සාකච්ඡා, සංවාද
- වාර්තා වැඩසටහන්
- සජීවී වැඩසටහන්
- ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන්
- දේශනමය වැඩසටහන්
- යථාකාරී රූපවාහිනී වැඩසටහන්

(ලකුණු 04)